**එස්. ඒ. ඩී. වයි. ධනසිරි විජේසිංහ,**

අංකඃ 56 ඒ, පොල්ගහඅගාර එස්ටේට්,

නිට්ටඹුව.

2020.05.11

ලේකම්,
පොලිස් කොමිසම් සභාව
අංක 9 ගොඩනැගිල්ල
බන්ඩාරනයක ගුණානුස්මරණ ජාත්‍යන්තර පරිශ්‍රය
බෞද්ධාලෝක මාවත
කොළඹ 7.

**බලහත්කාරයෙන් මාගේ ඉඩමට ඇතුල් වී මැරයින් යොදාගනිමින් තර්ජනය කිරීම් හා ඒ සම්බන්ධයෙන් නිට්ටඹුව පොලිස් ස්ථානයේ නිදැසීලි හා පක්ෂක්ග්‍රාහී ක්‍රියාකාරකම් සම්බන්ධයෙනි.**

මෙම කරුණ සම්බන්ධව 2020ක්වූ පෙබරවාරි මස 26 වන දිනද මා විසින් ලියාපදිංචි තැපෑලෙන් ඔබ වෙත කර ඇති බවද ඒ සඳහා කිසිඳු පිළිතුරක් මේ වන තෙක් නොලද බව ද සඳහන් කරනු කැමැත්තෙමි.

මා හට විරුද්ධව **ඇලැස්ටර් ක්‍රිස්ටෝපර් අශෝකා දසනායක** යන අය විසින් අත්තනගල්ල දිසා අධිකරණයේ නඩු අංක L /1339 දරණ නඩුකරය වර්ෂ 2018.03.06 දින පවරා පවත්වාගෙන යන ලදී. නමුත් මා හට අත්තනගල්ලේ පිහිටි පොල්ගහඅගාර නැමති වත්තෙන් ( මා වසර 20කට අධික කාලයක් පදිංචි ) අක්කර 20 ක් ප්‍රසිද්ධ නොතාරිස් ආර්.සී.බී. ජෝෂප් මහතා විසින් වර්ෂ 2008.03.08 දින ලියා සහතික කරන ලද අංක 1973 දරණ තෑගි ඔප්පුව මගින් නිතියානුකූලව අයිතිය ලැබීමෙන් මේ දක්වා භුක්ති විදින බවයි. මෙම ඉඩම **අයිරින් පිලිස් පෙරේරා විජේසේකර ගුණවර්ධණ** වන **ඇලැස්ටර් ක්‍රිස්ටෝපර් අශෝකා දසනායකගේ නැන්දනිය විසින්** මා හට තෑගි කර ඇත.

මා ප්‍රකාශ කර සිටින්නේ **ඇලැස්ටර් ක්‍රිස්ටෝපර් අශෝකා දසනායක** යන අය විසින් මෙම ඉඩමට ආරවුල් කිරිම මත මා විසින් වර්ෂ 2019.07.12 දින CIB II 358/88 , 2019.09.14 දින CIB III 267/215, 2019.10.13 දින CIB I 226/533, 2019.11.01 දින CIB

I 43/07, 2019.11.03 දින CIB II 328/35, 2019.11.05 දින CIB I 334/102ට දිනයන් හි නිට්ටඹුව පොලිසියට පැමිණිලි කර ඇති බවයි.

මා ප්‍රකාශ කර සිටින්නේ ඉහත අංක L / 1339 දරණ නඩුව වර්ෂ 20202.01.30 දිනට විභාගයට ගැනීමට නියම වු බවයි. නමුත් **ඇලැස්ටර් ක්‍රිස්ටෝපර් අශෝකා දසනායක** යන අයට වර්ෂ 2020.01.15 වැනි දින කොල්ලුපිටියේ දී කිසියම් පිරිසක් පිහියෙන් ඇන වෙඩි තබා ඇති අතර ඔහු වර්ෂ 2020.01.18 වැනි දින කොළඹ ජාතික රෝහලේ දි මිය ගොස් ඇති අතර මේ සම්බන්ධයෙන් මාගෙන් හා මාගේ පුතාගෙන් ද වර්ෂ 2020.01.20 දින හා වර්ෂ 2020.01.24 යන දින දෙකක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ප්‍රකාශ සටහන් කර ගන්නා ලදී.

මා කියා සිටින්නේ ඉහත අංක L / 1339 දරණ නඩුව වර්ෂ 2020.01.30 වෙනි දින ගරු අධිකරණයේ කැදවන ලද අවස්ථාවේදී කිසිම නිත්‍යානුකුල නියෝජිතයකු ගරු අධිකරණයට ඉදිරිපත් වි නොමැති බවත් මියගිය **ඇලැස්ටර් ක්‍රිස්ටෝපර් අශෝකා දසනායක** යන අයට දරුවන් නොමැති අතර කිසිම ඥාතියෙක්ද නොමැති බවත්ය.

මා විසින් **ඇලැස්ටර් ක්‍රිස්ටෝපර් අශෝකා දසනායක** යන අයගේ මරණය ආරංචි විමෙන් අනතුරුව මාගේ නිවසටද වර්ෂ 2019.11.01 දින යමෙක් උළු ගලවා වහලෙන් ඇතුළු වීමට තැත් කිරීම මත බියට පත්වු බවත් (මීට අදාලව මා විසින් නිට්ටඹුව පොලිසියට CIB I 43/07 යටතේ පැමිණිල්ලක් ද කර ඇත). තවද එම නිසා වර්ෂ 2020.01.19 දින මාගේ දේපළට ඇතුලු විමට ඇති ගේට්ටුවට ඉබ්බෙක් යෙදු බවත්, පසුව එදිනම රාත්‍රියේ 9.30ට පමණ එච්. පි. එස්. සිරිවර්ධන , විජේසිංහ හා නිශාන්ත නොහොත් ලොක්කා යන අය පැමිණ මා විසින් යොදන ලද ඉබ්බා ඉවත්කර වෙනත් ඉබ්බෙක් යොදන ලද බවත්ය. පසුදා උදසන එනම් 2020.01.20 දින ඉහත නම් සදහන් එච්. පි.එස්. සිරිවර්ධන හා නිශාන්ත නොහොත් ලොක්කා යන අයගෙන් ඉබ්බා කඩා දැමීම පිළිබද විමසීමේදී **කොළඹින්** ලැබුන උපදෙස් අනුව ඉබ්බා කඩා දමා වෙනත් ඉබ්බෙක් යෙදු බව ඔවුන් පිළිගෙන ඇති බව මා ප්‍රකාශ කර සිටින අතර එදින අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවේ නිළධාරින්ගෙන් අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණෙන ලෙසට වු දැන්වීම මත එහි ගොස් පැය 6 ක පමණ කටඋත්තරයක් **ඇලැස්ටර් ක්‍රිස්ටෝපර් අශෝකා දසනායක** යන අයගේ මරණය සම්බන්ධයෙන් ලබා දී සවස 6.45ට පමණ අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවෙන් පිටතට පැමිණෙන ලදී.

මා විසින් ගේට්ටුවේ ඉබ්බා කැඩීම සම්බන්ධයෙන් වර්ෂ 2020.01.21 වැනි දින නිට්ටඹුව පොළිස් ස්ථානයට CIB 1 363/383 යටතේ පැමිණිල්ලක් සිදු කළ බවත් එකී පැමිණිල්ල

වර්ෂ 2020.01.20 දින සිදු කිරිමට නොහැකි වුයේ මා සහ මාගේ පුතා අපරාධ පරික්ෂණ දෙපර්තමේන්තුවට කැදවීම නිසා ය.

***<u>මා කිසිම දිනක නොදුටු තෙවන පර්ෂවයක් අපගේ දේපළට බලහත්කාරයෙන් ඇතුල් වීම</u>***

වර්ෂ 2020.01.21 වැනි දින (WP)KW-5271 සහ 27 ශ්‍රි 6448 සහ තවත් කාර් රථයකින් නන්නාදුරණ අයෙක් වු **ඇන්ඩෘ සමරකොන්** හා **W.A. රණසිංහ** සහ **නිමල් ප්‍රේමසිරි** යන අය සමග පැමිණී අතර රණසිංහ බංගලාවේ දොර ඔහුට විවෘත කර දී වත්ත අයිති කෙනා ලෙස මා කිසි දිනක දැක නැති **ඇන්ඩෘ සමරකොන්** යන අය හදුන්වා දෙන ලදී. පසුව වර්ෂ 2020.01.22 දින ඉහත කී රථවලින් වත්ත අයිතියි කියන **ඇන්ඩෘ සමරකොන්** නැවත පැමිණ බංගලාවේ ඡායාරූප ලබා ගත් අතර පසුව W.A. රණසිංහ සමග පැමිණි තවත් පිරිසක් CCTV කැමරාවල් සවි කළ අතර එක් කැමරාවක් මා ජීවත් වන නිවස තුලටම ස්ථානගත කර සවිකර ඇත. වර්ෂ 2020.01.30 දින ද නාදුනන අයකු වු **ඇන්ඩෘ සමරකොන්** අයුතු ලෙස ඇතුළුවී මාගේ නිවස අසළ තිබු මල් පැළ ගලවා දමා මාගේ නිවසට එන අයගේ ජාතික හැදුනුම්පත් සහ වාහන පරීක්ෂා කරණ ලෙසට W.A. රණසිංහ යන අයට උපදෙස් ලබා දුන් බැවින් වර්ෂ 2020.01.30 දින නිට්ටඹුව පොළිස් ස්ථානයට CIB (1) 176/543 යටතේ පැමිණිල්ලක් කළ බවත්ය.
එකී පැමිණිල්ල විභාග කිරිමට වගඋත්තරකරු වු විත්තිකාර **නලීන් ඇන්ඩෘ සමරකොන්** යන අයට වර්ෂ 2020.02.01 හා 2020.02.04 කැදවීම් කළත් නොපැමිණි (කිසිම විටක දී වගඋත්තරකරු කැදවීමට 109 (6) දැන්වීම පවා නිට්ටඹුව පොලීසියෙන් සිදුකර තිබුනේ නැත). එබැවින් එදින මාගේ නීතිඥ මහතා විවිධ පැමිණිළි අංශයේ ස්ථානාධිපතිවරයාට දන්වා සිටියේ අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 109 (6) වගන්තිය යටතේ නොතිසියක් යවන ලෙසත්ය. ඒ අනුව අදාල නොතිසිය විවිධ පැමිණිළි අංශයේ ස්ථානාධිපතිවරයා අත්සන් කර මෙම විමසීම වර්ෂ 2020.02.08 දින පවත්වන බව දන්වමින් වගඋත්තරකරුට තැපැල් කිරිම මට ලබා දෙන ලදී. ඒ අතර වර්ෂ 2020.02.01. දින හෝ ඊට ආසන්න දිනකදී **නලීන් ඇන්ඩෘ සමරකොන්** සහ ඔහුගේ සේවක නියොජිත ආරක්ෂකයින් යැයි කියනු ලබන ඉතා හැඩිදැඩි පුද්ගලයින් ( අවි අයුධ සමග) ඉඩමට ඇතුල් වී මා සහ මාගේ බිරිද ද මුගේ පුතා සහ ඔහුගේ බිරිද ද පිළිවෙලින් වයස **අවුරුදු පහක්** වයස **අවුරුදු තුනක්** හා **මාස අටක්** වයසැති දරුවන් ද තැතිගන්නා ආකාරයෙන් හැසිරෙමින් වෝල්ට්

400 යේ (400W) ඉතා විශාල ආලෝක ධාරා (Flash Lights) මාගේ නිවසට යොමු කර ඇති අතර ඊට අමතරව එක එල්ලේ ම මාගේ නිවසටම CCTV කැමරා ද සවිකර මා ඇතුළු පවුලේ සියලුම දෙනා චිත්ත පීඩාවට පත් කරමින් විශේෂයෙන්ම ඉතා කුඩා දරුවන්ට දැඩි ආලෝක ධාරා පතිත කිරිම මත දැඩි මානසික පීඩාවකටද පත්වන ආකාරයෙන් ක්‍රියා කර **නලීන් ඇන්ඩෘ සමරකොන්** ඉතා විශාල කැමරාවක් රැගෙන වත්ත පුරා ඇවිදිමින් ඡායාරූප ලබා ගත් බවත්, මාගේ බිරිද මෙන්ම තරුණ ලේලියද එළියේ ස්නානය කිරිම සිදුකරන නිසා ඔවුන්ගේ ඡායා රූප ද ඇන්ඩෘ විසින් ඡායා රූප ගත කර ඇත්තේ දැයි සැකයක් පැවති නිසා මාගේ ලේලිය වු නිලුකා දමයන්ති මහත්මිය විසින් ඇයට හා ඇයගේ දරුවන්ට වන කායික හා මානසික හානිය සම්බන්ධයෙන් වර්ෂ 2020.02.04.වැනි දින නිට්ටඹුව පොළිසියේ ළමා හා කාන්තා කාර්යාංශයට WCIB 383/31 යටතේ පැමිණිල්ලක් සිදුකළ බවත් මේ වන තෙක් කිසිම විටකා එකී පැමිණිල්ල සම්බන්ධයෙන් මාගේ ලේලියට යුක්තිය ඉටු නොවුන බවත් මාගේ නිතිඥ මහතුන්ගෙන් ලැබුණු උපදෙස් අනුව දණ්ඩ නීති සංග්‍රහයේ 345 වගන්තිය යටතට ගැනෙන වරදක් නලීන් ඇන්ඩෘ විසින් සිදුකර ඇති බවත්ය.

තවද නලීන් ඇන්ඩෘ විසින් මාගේ දේපළට කිසිම අයිතියක් නොමැතිව වර්ෂ 2020.02.06 වැනි දින පුද්ගලික ආරක්ෂක අංශයේ කිහිපදෙනෙකු බලහත්කාරයෙන් දේපලේ රැදවු බවත්ය. එමගින් මා ඇතුළු පවුලේ සැවෝම භිතියට පත් පත්වී ඇති බවත්ය. එසේම නලීන් ඇන්ඩෘ විසින් පුද්ගලික ආරක්ෂාවට බව ප්‍රකාශ කරමින් මැර කණ්ඩායම් මාගේ දේපලට ගෙන්වා ගන්නා බවත් පොළිස්පති චක්‍ර ලේඛණ හා ආරක්ෂක අමාත්‍යාංශයේ ගැසට් පත්‍ර අනුව එවැනි ආකාරයෙන් අත්කොට කමිස ඇදගන්නා ලද පුද්ගලයින් සිවිල් පුද්ගලයකුට තම පුද්ගලික ආරක්ෂාවට යැයි ප්‍රකාශ කරමින් කෙසේ යොදවා ගන්නේ දැයි මා නොදනිමි.

මා කියා සිටින්නේ නලීන් ඇන්ඩෘට කිසිම අයිතියක් නොමැතිව මේ ආකාරයට මා සතු දේපළට බලහත්කාරයෙන් ඇතුල් විමට උත්සහ දැරිම කිසිසේත්ම පිළිගැනිමට නොහැකි බවත් මා උදෙසා සාධාරණය නිට්ටඹුව පොළිසියෙන් පවා ඉටු නොවිම පුදුම සහගත වන බවත් පොළිසිය විසින් මැරකම් කිරීමට සහ ඉඩම් කොල්ලකෑමට හිතා මතාම අවසර දී ඇති බවත්ය. වර්ෂ 2020.02.06 දින හෝ ඊට ආසන්න දිනකදී නලීන් ඇන්ඩෘ සමග ඉතා උස්මහත් ශරීර ඇති මැර පුද්ගලයින් වශයෙන් හැදින්විය හැකි පුද්ගලයන් කිහිප දෙනෙකු (WP) CAC - 2858 හා CAC - 1555 දරණ නවීන පන්නයේ මොටර් රථ දෙකකින් පැමිණ මාගේ නිවසේ දොර ඉදිරියේ නවත්වා කඩු , පිහි ආදි ආයුධ කිහිපයක් ඉන් ඉවත් කර බංගලාව තුලට ගිය බවත් එය දැකිමෙන් මා සහ මාගේ පවුලේ

අනෙකුත් අය මහත් තැතිගැන්මකට හා භීතියට පත්ව 119 හදිස්සි ඇමතුම් අංකයට ඇමතුම් කිහිපයක් පස්වරු 6.45 සිට ලබා ගෙන සිද්ධිය දන්වා සිටියත් පොළිසිය පැමිණියේ අදාල පිරිස පිටත් වි පැය ගණනාවකට එනම් පස්වරු 11.20 පමණ බවත්ය. මේ බව සනාත කිරිමට මගේ පුතා විසින් ජංගම දුරකතනයෙන් අදාල සිදුවීම විඩියෝගත කළ අතර ඊට අදාල විඩීයෝවක් ද මා සතුව ඇත. මා කියා සිටින්නේ පොළිසිය නිසිපරිදි ක්‍රියාත්මක නොවිම මත හා නිසි යුක්තිය කිසිම විටකදී මා වෙනුවෙන් ඉටු නොවීම මත ඉහත විඩියෝ දර්ශන අන්තර්ගත දර්ශණ සමාජ මාධයට , මුහුණුපොතට මුදාහරින ලද බවත් එසේ සිදු කිරිමට හේතුව වුයේ මා ඇතුළු පවුලේ සියලු දෙනාගේම ජීවිත අවධානම ගැන සිය ඥාතීන් හා සමාජය දැනුවත් කිරිමට බවත් ඇත්ත වශයෙන්ම පසුදා උදෑසන වන විට මා ඇතුළු පවුලේ සියලු දෙනාගේම ජීවිත අහිමි වී යනු ඇතැයි සාධාරණ හේතු තිබු නිසා බවත්ය.
මා ප්‍රකාශ කර සිටින්නේ නලීන් ඇන්ඩෘගේ ඉඩම් කොල්ලය ගැන නිට්ටඹුව පොළිසිය දැනුවත් කළත් කිසිම ක්‍රියා මාර්ගයක් නොගත් බවත් මාගේ නිතිඥ මහතා කරුණු දක්වමින් අයුතු ඇතුල් වීම හා අවම වශයෙන් සාමය කඩවීම වැලැක්වීමට ප්‍රාථමික නඩු විධාන සංග්‍රහ පනතේ 66 වගන්තිය යටතේ හෝ නඩු පවරා සාමය ආරක්ෂා කර දෙන ලෙස පොළිසියෙන් ඉල්ලා සිටියත් ඔවුන් ඒ සම්බන්ධයෙන් ක්‍රියා නොකළ බවත්ය.

මා ප්‍රකාශකර සිටින්නේ වර්ෂ 2020.02.07 දින හෝ ඊට ආසන්න දිනකදී නලීන් ඇන්ඩෘ පිරිසක් සමග පැමිණ මාගේ නිවස විඩියෝගත කළ බවත් එහි දී නලීන් සියලුම දේවල් රේකොර්ඩ් විය යුතු බවටත් වත්තට එන සියලුම දෙනාගේ ජාතික හැඳුනුම්පත පරික්ෂා කළ යුතු බවටත් , නිට්ටඹුව පොළිසිය බුදි නැති බව ප්‍රකාශ කළ බවත් , එම සිදුවීම සිදුවෙන විට දී ***මාගේ පුතාගේ කුඩා ළමයා එම සිද්ධිය දැකීමෙන් දැඩි කම්පනයනට ලක්වු*** බවත් එය ඉහත වීඩියෝ දර්ශණයේ ඇතුලත් බවත්ය.

***<u>නිට්ටඹුව මුලස්ථාන පොළිස් ස්ථානාධිපතිවරයා හමුවේ පැවති විභාගය</u>***

වර්ෂ 2020.02.08 දින නලීන් ඇන්ඩෘ යන අය නිතිඥ සමග විමසිම සඳහා පැමිණි අතර මෙම විමසුම විශේෂ කාර්යයක්සේ සළකා මුලස්ථාන පොළිස් ස්ථානාධිපතිතුමා ඉදිරියේ පැවැත්වු බවත් එහි දී නලීන් ඇන්ඩෘ දේපළ ඔහුට අයත් බව ප්‍රකාශ කර ඔහුගේ උපදෙස් මත ඉබියතුරු යොදා තිබු ගේට්ටුව විවෘත කිරිමට ඔහු එකග වු බවත් ඔහු විසින් යොදවා ඇති සේවකයන් දින 03ක් ඇතුලත ඉවත් කර යොදා ඇති පලංචි ඉවත් කර ගැනිමට

පොරොන්දු වූ බවත්ය. ඒ බව තහවුරු කිරීමට වර්ෂ 2020.02.08 දින CIB (1) 374/146 හි ඔහුගේ ප්‍රකාශය ඇත. නමුත් මේ මොහොත දක්වා එය ඉටු නොවූ බව කියා සිටිමි.

මා ප්‍රකාශ කර සිටින්නේ, දේපල සම්බන්ධයෙන් කුමන හෝ ආකාරයේ හිමිකමක් හෝ අයිතියක් ඇන්ඩෘට නොමැති බවත්, කිසිම විටකදී මූලස්ථාන පොලිස් ස්ථානාධිපතිවරයා ඇන්ඩෘ මෙම ඉඩමට ඇතුල් වීමට උත්සහ දරන්නේ කුමන අයිතියක් කුමණ ලේඛනයක් පදනම් කරගෙන ද යන්නවත් අවම වශයෙන් ප්‍රශ්ණ නොකළ බවද ඇන්ඩෘ සහ ඔහුගේ සේවක නියොජිත ආරක්ෂකයින් යැයි කියනු ලබන ඉතා හැඩිදැඩි පුද්ගලයින් ඉඩමට ඇතුල්වී රැඳී සිටීමට උත්සහ ගැනිම වැරදිසහගත සහ නීති විරෝධී බවත් මාගේ අයිතිවාසිකම් උල්ලංඝණය කරන ක්‍රියාවක් බවත් ය. අදාල දේපළ මාහට සහ මාගේ පුතනුවන් හටද ජීවිත තජර්න මැරයින් ලවා අද දින පවා සිදු කරමින් විවිධ බාධා කිරිම් සිදු කොට වෙනත් ආකාරයකින් නිති විරෝධි ලෙස අත්කර ගැනීමට උත්සාහ දරමින් සිටින බවට විශ්වාසදායක තොරතුරු පවතින බවය. මෙහි මූලිකත්වය ගෙන කටයුතු කරනු ලබන්නේ නලින් ඇන්ඩෘගේ උපදෙස් මත දැනට වත්තේ සිටින රණසිංහ, සුරංග, සහ කතික් පුද්ගලික ආරක්ෂක සේවයේ ප්‍රියන්ත යන අය විසින්ය. මොවුන් ඉහත මා සඳහන් කල පරිදි නිට්ටබුව පොලිසියේ උපදෙස් සහ දැනුවත්කම මත බලහත්කාරයෙන් දැනට වත්තේ පදිංචි කර ඇති අය වලුන්ය.

මේ සම්බන්ධයෙන් පැමිණිලි 20කට අධික ප්‍රමාණයක් කර ඇතත් නිට්ටඹුව පොළිසියෙන් සාධාරණය ඉටු නොවීම නිසා මා විසින් සහකාර පොලිස් අධිකාරී හා ඊට ඉහළ සියලුම නිළධාරීන් ද දැනුවත් කළත් යම් අදෘෂයමාන බලවත් හස්තයකින් සියලුම ක්‍රියාමාර්ග වලක්වන බවත්ය.

මා විසින් අත්තනගල්ල දිසා අධිකරණයේ නඩු අංක 1511 එල් දරණ නඩුව නලීන් ඇන්ඩෘ සමරකොන්ට එරෙහිව පවරා ඔහුට සහ ඔහුගේ යටතේ සිටින සියලුම සේවකයින් , නියෝජිතයින් සහ ඔහු යටතේ සිටින සියලුම අය එකී උපලේඛණ ගත දේපලේ සහ පරිශ්‍රයේ පවත්නා ආකාරයට පවත්වා ගැනීමටත් විෂය වස්තුව වෙනස් නොකිරීමටත් තහනම් නියෝගයක් වර්ෂ 2020.02.24 ලබා ගන්නා ලදී. පසුව පොළීසිය විසින් අදාල පර්ශවය බලහත්කාරයෙන් ඉඩමට ඇතුල් වී මසකට පසුව 66 වගන්තිය යටතේ නඩු පවරා ඇත. පසුව එකී තහනම් නියෝගය නලීන් ඇන්ඩෘ සමරකොන් සහ ඔහුගේ යටතේ සිටින සියලුම සේවකයින්, නියෝජිතයින් කඩ කිරීම මත නිට්ටඹුව පොළිසීට පැමිණිලි

කිරීමට ගිය විට දෙපාර්ශවයටම විරුද්ධව 81 වගන්තිය යටතේ නඩු අංක 73268 හා 73269 යටතේ නඩු පවරන ලදී.

ගරු අධිකරණයෙන් ඉඩමේ ස්වභාවය වෙනස් නොකිරීමට තහනම් නියොගයක් පවතිද්දී නලීන් ඇන්ඩෘ සමරකොන්ගේ සියලුම සේවකයින් , නියෝජිතයින් දේපලේ අන්නාසි හොර රහසේ කැපීම සහ පොල් කැඩීම සිදුකරයි .තවද වර්ෂ 2020.04.22 නාදුනන පුද්ගලයින් කිහිපදෙනෙක් වත්තට ඇතුළු වී ඇති අතර ඒ සම්බන්ධයෙන් වර්ෂ 2020.04.22 CIB III 393/113 යටතේ පැමිණිල්ලක් සිදු කළත් කිසිම ඵලක් නොවුනි. තවද මෙම දේපලේ ඇති නිවසට නාදුනන අය නිතර පැමිණෙන අතර ඒ සෑම විටම පොලිසීය දැනුවත් කළත් (119 සහ 118 සහ 033-2287224 යන නිට්ටඹුව මූලස්ථාන පොලිසියේ දුරකථන අංකයට) කිසිම විටක පැමිණියේ නැත. එසේම මාගේ පවුලේ සියලුම දෙනාගේ ජීවිත අවදානමක මේ වන විටත් පවතින අතර අපගේ ජීවිත වලට යම් හානියක් වුව හොත් නිට්ටඹුව පොළිසීයේ මූලස්ථාන ස්ථානාධිපතිවරයා ඊට වගකිව යුතුය. මන් ද අපගේ දේපලට අයතු ලෙස ඇතුලත් වීමට අවසර ලබා දුන්නේ ඔහු වන බැවිනි.

කොල්ලුපිටියේ පදිංචි **ඇලැස්ටර් ක්‍රිස්ටෝපර් අශෝකා දසනායක** යන අය නිවසේ සේවකයෝ 11 දෙනෙකු සිටින විට ඝාතනය වන්නේ කෙසේ ද නලීන් ඇන්ඩෘ සමරකොන් යන අයද ජීවත් වන්නේ ද **ඇලැස්ටර් ක්‍රිස්ටෝපර් අශෝකා දසනායක** සිටි කර්නල් ටි.ජී ජයවර්ධන මාවතේම වේ . මෙම ඝාතනය වු අයගේ දේපල අත්කර ගැනීමට නලීන් ඇන්ඩෘ යන අය කෙසේ ඉදිරිපත් වන්නේ ද යන්න මහත් සැකයක් පවතින්නේ ය. නලීන් ඇන්ඩෘ යන අය දැනටමත් අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තුවේ නිළධාරීන්ටද බලපෑම් කර ඇති බව මාගේ හැගීමයි. එසේම මා ජීවත්වන වත්තේ බලහත්කාරයෙන් පදිංචි වී සිටින්නේ කවුරුන් ද වත්තකට බලහත්කාරයෙන් ඇතුළු වී පුද්ගලික ආරක්ෂක අංශය යොදවන්නේ කෙසේද යන්න නිට්ටඹුව පොළිසීයේ අනුග්‍රහයෙන් සිදුවන්නකි.

අද දිනද අපගේ ජීවිත මේ මොහොතේ පවා අවිනිශ්චිත තත්වයක පවතින අතර ඉතාමත් විශ්වාසදායක තොරතුරු අනුව පසුගිය සතිය තුල මොටසර්යිකලයක රණසිංහ යන ඇය සමග පැමිණ සැඟව බංගලාවේ සිටි අතර අපගේ සියැසින් ඔහු පිස්තෝලයක් සහිතව දුටු බවත් මේ මොහොතේදීද බංගලාව තුල එම පතොරුම් තුවක්කුවක් සහ පතොරුම් හයක් අප සමුල ඝාතනය කිරීමේ අරමුණින් තබා ඇති බවත් නිට්ටබුව පොලිසිය මේ සම්බන්දයෙන් දැනුවත් බවත් කියා සිටිමි.

නිට්ටඹුව මූලස්ථාන පොලිස් පරීක්ෂකතුමා රණසිංහ සහ කතික් පුද්ගලික ආරක්ෂක සේවයේ නියුතු අයට කියා ඇත්තේ පොල් සහ අන්නාසි කඩා විකුණා ගන්න ලෙසත් මොනයම් ප්‍රශ්නයකදී හෝ ඒ ගැන බලාගන්නා බවත් මා සහ මාගේ පුතා ඉහල ආයතනවලට අප හට සිදුවන මේ අසාධාරණය සහ අයුක්තිය පිලිබඳව පැමිණිලි කර ඇති බව ඔවුන්ට පවසා උපදෙස් දී ඇත්තේ අපගේ ජීවිත කුමන අයුරකින් හෝ අවසන් කරන ලෙසයි.

ඉහත කරුණු රටේ සාමය සහ නීතිය පවත්වාගෙන යාම සඳහා අපක්ෂපාතීව කටයුතු කිරීමට පත් කර ඇති පොලිස් කොමිසමෙන් අප හට සාධරණයක් ජීවිත හානියක් සිදුවීමට පෙර ඉටුකර දෙනු ඇතැයි කීර්තිමත් හා බුද්ධිමත් ඔබ වැනි ජ්‍යේෂ්ඨ නිළධාරින් අවබෝධ කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇතැයි මා බලාපොරොත්තු වෙමි. මේ සම්බන්ධයෙන් අවශ්‍ය සියලු ලිය කියවිලි සහ වීඩියෝ දර්ශන මා සතු අතර අවශය ඕනෑම විටක ඉදිරිපත් කිරිමට මා සුදානම් බවද ඔබට දන්වා සිටිමි.

ස්තුතියි

මීට,

විශ්වාශී

**එස්. ඒ. ඩී. වයි. ධනසිරි විජේසිංහ**

දුරකථනය - 077-6305982